# ශ්‍රී ලංකාවේ තේ වගාවේ ආරම්භය හා විකාශය පිළිබඳ විමසීමක්

බී.ඒ.බී. මධුභාෂනී[1]

**සංක්ෂේපය**

ක්‍රි. පූ. 2737 දී පමණ චීනයේ ෂෙන් නුං අධිරාජ්‍යයා විසින් පානයක් වශයෙන් හඳුන්වාදෙනු ලැබීමත් සමඟ තේවල උපත සිදු වී යැයි සලකනු ලැබේ. මෙසේ උපත ලද තේ වගාව 1867 දී පමණ ශ්‍රී ලංකාව තුළ වාණිජමය වැවිලි භෝගය ලෙස ව්‍යාප්ත විය. වර්තමානය වන විට තේ අප ප්‍රධාන අපනයන වැවිලි භෝගයක් මෙන් ම අප රටට විනිමය සපයන ප්‍රධාන අපනයන මාර්ගයක් වශයෙන්ද හඳුන්වා දිය හැකිය. ශ්‍රී ලංකාවේ තේ වගාවේ ආරම්භය හා විකාශය පිළිබඳව අධ්‍යනය තුළින් එය අප රටේ අපනයන භෝගයක් වශයෙන් ද ඉටු කරන්නා වූ කාර්යභාරයද, වර්තමානය වන විට තේ වගාවේ පසුබිම පිළිබඳව ද අධ්‍යනය කිරීම මෙහි අරමුණ වේ. මේ සඳහා සඟරා පොත්පත් අන්තර්ජාල තොරතුරු වැනි ද්විතීයික දත්ත මුලාශ්‍ර යොදා ගැනුණි. තේ වගාව 2015 වන විට හෙක්ටායාර දශ ලක්ෂ 222 ක පරාසයක් දක්වා පැතිරී ඇති අතර තේ අපනයන වෙළෙඳපළේ තේවල වටිනාකම රුපියල් දශ ලක්ෂ 182 054 ක ප්‍රමාණයකින් වර්ධනය වී ඇත.

මුඛ්‍ය පද : තේ වගාව,වැවිලි බෝග, වාණිජමය, අපනයන, වෙළෙඳපොළ

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ආර්ථික සමාජ සහ පාරිසරික යන අංශයන්ගෙන් ඉතා වැදගත් කාර්යභාරයක් වැවිලි අංශයන් විසින් ඉටු කරනු ලබයි. ප්‍රධාන වැවිලි බෝග අතරට තේ, පොල්, රබර් යන බෝග හඳුන්වා දිය හැකි ය. ශ්‍රී ලංකාව තුළ වගා කළා වූ ප්‍රථම වැවිලි භෝගය ලෙස කෝපි වගාව හඳුන්වා දිය හැකි අතර, මෙම කෝපි වගාව "හෙමිලියා වැස්ටාට්‍රික්ස්" (Hemilea vastatrix)නම් කොළ දිලීර රෝගයකට ලක්ව සම්පූර්ණයෙන්ම විනාශ වීමෙන් පසු වාණිජමය බෝගයක් ලෙස 1867දී ජේම්ස් ටේලර්(JAMES TAYLOR)විසින් නුවර එළිය දිස්ත්‍රික්කයේ ලූල් කඳුර වත්තේ (LOOLE CONDERA)වත්තේ අක්කර 19ක පමණ (හෙක්ටායාර 8 ක පමණ) තේ වගාව ආරම්භ කර ඇත. ශ්‍රී ලංකාවේ දේශගුණය සහ පස තේ වගාවට බෙහෙවින් යෝග්‍ය විය. තේ වගාව ආරම්භක අවධියේ දී එනම් 1867 දී හෙක්ටාර් 8 පමණ කුඩා ප්‍රදේශයක තේ වගාව ව්‍යාප්ත කළද පසුව එය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. ඒ අනුව 2015 වර්ෂය වනවිට තේ වගාකළ මුළු බිම් ප්‍රමාණය හෙක්ටාර් දශ ලක්ෂ 222 ක පමණ පරාසයක් දක්වා පැතිරී ඇත.මේ අකාරයට තේ වගාව වර්තමානය වන විට ශ්‍රී ලංකාවේ අපනයන ක්ෂෙත්‍රය තුළ විශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි.

## ලෝකයේ තේ වගාවේ ආරම්භය

ක්‍රි. පූ. 2737 දී පමණ චීනයේ ෂෙන් නුං අධිරාජ්‍යයා විසින් පානයක් වශයෙන් හඳුන්වාදෙනු ලැබීමත් සමඟ තේවල උපත සිදු වී යැයි සලකනු ලැබේ. වියළි තේ කොළවල සාරයෙන් සාදා ගන්නා ලද බීමක් පිළිබඳව ඉපැරණි පැරණි හා ජපන්

[1] ශාස්ත්‍රවේදී (විශේෂ) ආර්ථික විද්‍යා තෙවන වසර, buddhikku@gmail.com

පුරාවෘත්තවල සඳහන් වේ. තේ පිළිබඳ පැරණිතම ලිඛිත සඳහන දක්නට ලැබෙන්නේ ක්‍රි. පූ. 350 දී ලියන ලද "ආර්යා" (Erhya) නැමති පුරාණ චීන ශබ්දකෝෂයකය. තේ (වාචිං) පිළිබඳ පළමු ලියවිල්ල ක්‍රි.ව. 780 දී ලුයූ (Luyu) විසින් පළ කරන ලදී. (ජයවර්ධන,2008).

ක්‍රි. පූ. 5 වන සියවසේ පමණ චීනයේ බොහෝ සෙයින් ජනප්‍රියව තිබූ තේ ක්‍රි. පූ. 8 වන සියවස පමණ වනවිට චීන ජනතාවගේ දෛනික ජීවිතයේ අත්‍යවශ්‍ය අංගයක් බවට පත් වී තිබුණි. මෙසේ චීනය විසින් සොයාගෙන අත්හදා බලා ජනප්‍රිය කළ තේ පානය පසුව ලොව පුරා ව්‍යාප්ත කරන ලදී. චීනයේ අවට රටවල මුලින් ම මෙම පානය ජනප්‍රිය විය. ජපානයේ ජන ජීවිතයට තේ පානය තදින් සම්බන්ධ විය. එබැවින් ජපන් ජාතික උත්සවවල දී තේ උත්සව ද ප්‍රමුඛ ස්ථානයක් ගැණිනි. මේ අතර ජපන් ජාතික උත්සව වලදී තේ උත්සවද ප්‍රමුඛ ස්ථානයක් ගැණුනි. (ආර්ථික විමසුම,1995). මේ අතර චීන වෛද්‍යවරුන් මිනිසාගේ ගත සිත පුබුදුවාලිය හැකි, උද්යෝගයක් ලබා දෙන , සිරුරේ නිරෝගී බව ලබාදෙන ඖෂධීය ගුණයෙන් යුත් පානයක් ලෙස තේ හඳුන්වා දීම මෙම පානය ජනප්‍රිය විමට හේතුවයි.

මුල් කාලයේ චීනයේ භාවිතා කළ පානයක් වුවත්, මෙහි පෙරළිකාර ව්‍යාප්තිය සිදුවූයේ "සැමුවෙල් පෙපියස්" නැමැත්තා විසින් මෙයට වසර 225 කට පෙර මෙම පානය එංගලන්තයට හඳුන්වා දීමෙන් පසුව ය. (විද්‍යාරත්න,2001). මෙය තේ පිළිබඳව තීරණාත්මක සිදුවීම් හා මෑතකාලින තේ පිළිබඳ කතාන්දරයේ ආරම්භය යි. මෙම කාලය වන බ්‍රිතාන්‍ය තුළ විශාල ලෙස ධනවතුන් සිටීමත් නිසා බ්‍රිතාන්‍ය යටත් විජිතවල ද තේ ජනප්‍රිය විය. මේ නිසා අන් රටවලට තේ හඳුන්වා දීමේ ප්‍රබල ම හේතුව බ්‍රිතාන්‍යය හරහා සිදුවී ඇත. බ්‍රිතාන්‍යයේ කාර්මීකරණ සමයේ දී බිහි වූ මහා සහ සුළු නගර ප්‍රදේශවල දැවැන්ත ඉල්ලුමක් පැවති බියර් වෙනුවට හොඳ ආදේශක පානයක් ලෙස තේ ජනප්‍රිය විය. මෙලෙස තේ ජනප්‍රිය පානයක් වීමත් සමඟ ම තේ සඳහා හොඳ ඉල්ලුමක් ඇති විය (සිරිවර්ධන,2000).

තේ පිළිබඳව එංගලන්තයේ කරන ලද පළමු සඳහන වන්නේ 1615 දී ආර්.එල්. වික්හැම් විසින් කරන ලද සඳහන වන නමුත් ශත වර්ෂ කිහිපයකට පසු එනම් 1559 දී ප්‍රකට වැනීසියානු ලේඛකයකු වූ ගියන් බැටිස්ටා රැමුසියෝ විසින් තේ (චායි චට්ටයි) යුරෝපයේ අවධානයට ලක් කරන ලදී. මෙකල වන විට යුරෝපය දැන සිටි එකම පානය වූයේ කෝපි ය. එසේම පළමු තේ පැකැට්ටුව ලන්ඩනයේ ගෝල්වේස් කෝපි හවුස්හි අලෙවි කරන ලද්දේ 1657 දී ය. ඉන් ඉක්බිතිව 1684 දී, ඕලන්ද තේ රස බලන්නෙකු වූ ජේ.අයි.එල්. ජාකොබ්සන් චීනයේ මනා ලෙස ආරක්ෂිත සහ තහනම් වූ තේ වතුවලට ප්‍රවේශ වීමට සමත් විය. ඒ අනුව හෙතෙම දැඩි පෞද්ගලික අවධානමක් මධ්‍යයේ වුව ද තේ ඇට කිහිපයක් ඉන්දුනිසියාවට රහසේ රැගෙන විත් චීනය සතුව තිබූ තේ නිෂ්පාදනයේ ඒකාධිකාරය බිඳ දැමීය.(ආර්ථික විමසුම,1995).

ඇසෑමයේ කඳුකර ගෝත්‍රික ජනතාව දීර්ඝ කාලයක් තිස්සේ තේ වගා කරන ලදැ'යි විශ්වාස කරනු ලැබුව ද ඉන්දියාවට තේ හඳුන්වාදෙන ලද්දේ 19 වන සියවසේ ආරම්භයේදී ය. ඉන්දියාවේ වාණිජ වශයෙන් තේ වගා කිරීම සඳහා සනාථ කරන ලද ප්‍රථම ප්‍රයත්නය දරන ලද්දේ ඇසෑමයේ සිබ්සාගර් දිස්ත්‍රික්කය තුළ කැලයේ තේ වැවී තිබෙනු 1832දී මේජර් රොබට් බෲස් විසින් සොයා ගනු ලැබීමෙන් අනතුරුවය. එහි සිට 1839 දී තේ පැලය පේරාදෙණියේ උද්භිද උද්‍යානයට ගෙන එන ලදී(ජයවර්ධන,2008).

යුරෝපය සහ ආසියාව අතර වාණිජ සබඳතා දියුණු වීමත් සමඟ ම 17 වන ශත වර්ෂයේ මුල් භාගයේ දී යුරෝපයට තේ හඳුන්වා දෙනු ලැබිණ. ආසියාව තුළ කටයුතු

කළ බ්‍රිතාන්‍ය වෙළෙඳ සමාගම්වල විදේශ වෙළෙඳාමේ ආධිපතිත්වය දැරූ බ්‍රිතාන්‍ය පෙරදිග ඉන්දීය වෙළෙඳ සමාගම 1715 වන විට කැන්ටන්හි මනාව ස්ථාපිත වී තිබිණ. තේ වෙළෙඳාම කොතරම් ශීඝ්‍රයෙන් වැඩිවී ද යත් 1805 දී එංගලන්තය තේ රාත්තල් මිලියන 7.5 ක් ආනයනය කළහ. 1803 දී පමණ ඉන්දියාවේ නිෂ්පාදනය කරන ලද තේ ලන්ඩනයේ අලෙවි වීම ආරම්භ වූ අතර ක්‍රමානුකූල සැපයුමක් අඛණ්ඩව ඇති වීමත් සමගම නූතන තේ කර්මාන්තය ආරම්භ වී යැයි සලකනු ලැබේ(ආර්ථික විමසුම,1995).

## ශ්‍රී ලංකාවට තේ හදුන්වා දීම සහ වාණිජමය වැවිලි බෝගයක් ලෙස ව්‍යාප්ත වීම

1867 වර්ෂය ශ්‍රී ලංකාවේ තේ වගාව ආරම්භ වූ වර්ෂය ලෙස ප්‍රචලිත වුවත් එම වසරට පෙර තේ තිබූ බවට සාධක ඇත. ලංකාවේ පෘතුග්‍රීසි සහ ලන්දේසි යුගවලද තේ ගෙවතු වගාවක් ලෙස තිබූ බවට සාදක ඇත. නමුත් වගාවක් ලෙස ව්‍යාප්ත නොවීය. මේ පිළිබඳ සාක්ෂි සොයා බැලීමේදී 1816 දී Mr.Ringletauba තේ ගැන සඳහන් කර Mr. James richards වෙත ලිපියක් ලියා ඇත. එහිදී ශ්‍රී ලංකාවට තේ සංස්කෘතිය හඳුන්වා දෙන ලෙස සඳහන් කර ඇත. ඒ අනුව Mr.Moyard ගේ කළුතර පිහිටි ඉඩමේ තේ සිටුවා ඇත. මේ පිළිබඳ පැහැදිලි සාක්ෂි නැතත් කළුතර පැරණි උද්භිද උද්‍යානයේ තේ පැළ දක්නට ලැබෙයි. එම තේ පැළ මෙම ඉපැරණි ඒවායැයි අපට අනුමාන කළ හැකිය(විද්‍යාරත්න,2001).

1839 දෙසැම්බර් ශ්‍රී ලංකාවේ පේරාදෙණිය උද්භිද උද්‍යානයට ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට තේ ඇට ගෙනා බවට ලිඛිත සාක්ෂි හමුවෙයි. මෙම තේ බීජවලින් නුවර එළියේ සර් ඇන්තනී මහතාගේ වත්තේ වගාකර අත්හදා බලා ඇත. මේ පිළිබඳව 1866 පේරාදෙණියේ Administation Report හි සඳහන්ව ඇත. ශ්‍රී ලංකාවේ තේ හඳුන්වා දීමට උත්සාහ කළ විදේශිකයන්ගේ අදහස වුයේ විදේශ විනිමය ඉපැයිය හැකි බෝගයක් ලෙස ප්‍රචලිත කිරීමයි. 1842 අප්‍රේල් මාසයේ දී Dr.Wallich තවත් තේ වර්ගයක් ඉන්දියාවෙන් ගෙන්වා එම වර්ෂය තුළම ඔක්තෝම්බර් මාසයේදී නුවරඑළියේ Mr.Moouyart වෙත යැවූ අතර ඔහුගේ ගෙවත්තේ විසිතුරු පැළ ලෙස තේ පැළ 30 ක් පමණ වගා කළ බව සඳහන් වෙයි( ජයවර්ධන,2008).

1886 අගෝස්තු 18 ලන්ඩන්වල පැවති ප්‍රදර්ශනයක දී ඉන්දියාව ගැනත් අනෙක් යටත් විජිත ගැනත් සඳහන්ව ඇත. එහිදී සඳහන් කර ඇති පරිදි ප්‍රථම තේ පැළය චීනයේ සිට ශ්‍රී ලංකාවට 1840 දී ගෙන්වා ඇති බව සඳහන් කරයි. Mr. Geep විසින් The Times සඟරාවට ලිපියක් යවමින් ලංකාවට තේ හඳුන්වා දුන්නේ ලන්දේසි සමයේ බව සඳහන් කරයි. චීනයේ තේ ගෙන්වූයේ 1840 බව සඳහන් කළ Mr. Geep ලංකාවේ සිටියේ 1842- 1845 කාලය තුළ දී ය. ඔහු 1843 නුවර එළියේ ජීවත් වූ සමයේ අක්කර භාගයක පමණ තේ වත්තක් වගාකර ඇති බව සඳහන් කර ඇත( විද්‍යාරත්න,2001) ඔහු පවසන්නේ ලංකාවේ ප්‍රථමයෙන් තේ වැව්වේ තමා බවත්,තේ වගාකිරීම පිළිබඳ අත්හදා බැලීම සාර්ථක වී ඇති බවත් ය.

1830 ගණන්වල සිට ශ්‍රී ලංකාවේ තේ ගැන අත්හදා බැලීම් පිළිබඳ සඳහන් වුව ද ඒවා එතරම් ජනප්‍රිය නොවී ය. කෝපි වගාවට වැළඳූ, දිලීර රෝගයක් නිසා එය විනාශ වීමත්, බ්‍රිතාන්‍ය තුළ තේ ජනප්‍රිය වීමත් යන සාධක නිසා වැවිලිකරුවන් තේ කෙරේ අවධානය යොමු කළ බව කිව හැකිය. මේ අනුව වාණිජමය බෝගයක් ලෙස 1867 දී JAMES TAYLOR විසින් නුවරඑළිය දිස්ත්‍රික්කයේ LOOLE CONDERA වත්තේ අක්කර 19 ක පමණ (හෙක්ටයාර 8 ක පමණ) තේ වගාවක් ආරම්භ කර

ඇත. මෙලෙස ප්‍රථමයෙන් වගා කළ තේ වගාවෙන් ලන්ඩන් තේ වෙළඳපොළේ දී ඉහළ ම මිලක් ලැබී ඇත. මෙසේ වාණිජමය තේ වැවිල්ල 1877 දී හෙක්ටයාර 1094 (අක්කර 2700) දක්වා 1890 හෙක්ටයාර 89, 100 ලෙස ද, 1900 වන විට හෙක්ටයාර 155,520 දක්වා ද ශීඝ්‍ර ලෙස වර්ධනය වී ඇත( විද්‍යාරත්න,2001) මෙසේ තේ වගාව ශීඝ්‍ර ලෙස වර්ධනය වීමත් සමඟ ම තේ ලංකා ආර්ථිකයේ වැදගත් ම වැවිලි බෝගය බවට පත් වී ඇත.

1930 දී තේ වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 185085 දක්වාද , 1940 දී හෙක්ටයාර 223,074 දක්වාද 1970 දී හෙක්ටාර් 241,986 දක්වාද වර්ධනය වී ඇත. 1970 වන විට තේ  නිෂ්පාදනය කිලෝ මිලියන 212.2 දක්වා වර්ධනය වී ඇත. මෙසේ "තේ කර්මාන්තයේ ශීඝ්‍ර වර්ධනයත් සමඟ ම ශ්‍රම ඉල්ලුමද ශීඝ්‍ර ලෙස ඉහළ ගියහ. මෙයට හේතුව කෝපිවලට සාපේක්ෂව තේවලට ශ්‍රමය බහුලව අවශ්‍ය වීමයි. ශ්‍රම ඉල්ලුම වර්ධනය වුයේ සිත් මවිත කරන ලෙසයි". මෙය තවත් තහවුරු වන්නේ කෝපි අස්වනු එකතු කිරිමට එක් අක්කරයකට එක් කුලි කරුවෙකු සෑහීමට පත් වුව ද තේ සඳහා කුලීකරුවන් තුන් දෙනෙක් හෝ හතර දෙනෙක් අක්කරයක් සඳහා අවශ්‍ය වීම යි. එසේම තේ අක්කරයකින් පවුම් 600 පමණ උපයා ගත හැකි බවද කියවේ. මෙලෙස තේ වගාවත් සමඟ ම බහුලව මෙන්ම ඒකාකාරී ශ්‍රම අවශ්‍යතාවයක් පැන නැගුණි. එත් සමඟම බ්‍රිතාන්‍යයන්ගේ වතුවල වැඩ කිරීමට ශ්‍රමිකයන් බහුල ලෙස අවශ්‍ය විය.

නමුත් පාරම්පරික සිංහලයන් බ්‍රිතාන්‍ය පාලකයන්ගේ තේ වතු වල වැඩ කිරීමට අකැමැති වූ හෙයින් ඔවුන්ට විකල්ප කෙරේ යොමු වීමට සිදු විය. මෙහිදී බහුතර ශ්‍රමික සංඛ්‍යාවක් දකුණු ඉන්දියාවෙන් ගෙන් වනු ලැබූ අය විය. මුල් කාලයේ දී ශ්‍රමිකයන් ගෙන් බහුතරයක් පිරිමි වූහ. නමුත් තේ වගාවත් සමඟම පිරිමි කාන්තා සහ ළමයි යන තුන් වර්ගයටම මෙරට පදිංචි වී එක දිගටම ශ්‍රමය සපයන්නට වූහ. 1929 දෙසැම්බර් වන විට පිරිමින් 243,335 ද කාන්තාවන් 234390 ද ළමයින් 264,575 ද ලෙස සමස්ත සංක්‍රමණිකයෝ 742297 දෙනෙක් ලංකාව තුළ වූහ. මේ අතරින් බ්‍රිතාන්‍ය වැවිලිකරුවන්ට ලාභම ශ්‍රමිකයන් වුයේ ළමා ශ්‍රමයයි. මෙම කම්කරුවන් සඳහා නිවාස සැදීමේදී වෙන වෙනම නිවාස සෑදීමට වඩා එක පේළියකට සිටින සේ එකිනෙකට අනුබද්ධිත කාමර සාදා දීම වැවිලි කරුවන්ට වාසි විය. ඒවා COOLYLINES, LABOR LINES ලෙස හැඳින්විය.(ඊරියගම, 2011 :පි.53)මෙම නිවාස ක්‍රම සඳහා මුල් කාලයේ සපයන ලද සෞඛ්‍ය පහසුකම් ඇති කිරීම පිළිබඳ නිතිමය අවශ්‍යතාවයක් 1912 දී ඇති විය. මේ සඳහා වැවිලිකරුවන් ගෙන් යම් බද්දක් එකතු කර සෑම තේ වත්තකම කුඩා ආරෝග්‍ය ශාලාවක් ස්ථාපිත කළහ.

එසේම මුල් කාලින වතුවලට ඉන්දීය කුලීකරුවන්ගේ දරුවනට අධ්‍යාපන පහසුකම් ද සපයා නැත. ඊට හේතුව ඔවුනට අධ්‍යාපන පහසුකම් සැපයුවහොත් එම ශ්‍රමිකයන් වතු වගාවට  අහිමි වී යැයි යන සැකයක් තිබීමයි. එසේම අධ්‍යාපනය යනු මුලික මිනිස් අයිතිවාසිකමක් ලෙස නොසැලකීය. නමුත් 1920 වන විට මේ තත්ත්වය වෙනස් විය. 1924 වන විට අවුරුදු 6-10 දරුවන්ට අධ්‍යාපන පහසුකම් ලබා දුණි. පසුව ඔවුන්ගේ වයස අවුරුදු 16 දක්වා අධ්‍යාපන පහසුකම් ලබා දෙන ලදී. " බොහෝමයක් වතු පාසැල් 1924-1948 දක්වා පිහිටු වන ලද ඒවාය. (ද සිල්වා,2005)මෙසේ ආරම්භ වී ව්‍යාප්ත වූ තේ වගාව උඩරට පහතරට හා මැදරට යන සෑම වූ ප්‍රදේශයකම වාගේ ව්‍යාප්ත වී ඇත. ශ්‍රී ලංකාව දිස්ත්‍රික්ක වශයෙන් සලකන විට නුවර එළිය, බදුල්ල, මහනුවර, කෑගල්ල, රත්නපුර, මාතලේ, කළුතර, ගාල්ල, මාතර, මොණරාගල ආදී සෑම දිස්ත්‍රික්කයකටම පාහේ තේ වගාව පිහිටා ඇත.

## ශ්‍රී ලංකාවේ තේ වගාවේ ව්‍යාප්තිය

1867 හෙක්ටාර් 8 කින් ආරම්භ වූ තේ වගාව ඉතා ශීඝ්‍ර ලෙස වර්ධනය වී 1982 වන විට එහි උපරිමයට පත් වී ඇති බවයි. ඉන් පසුව 1990 වන විට වගා කළ බිම් ප්‍රමාණයේ යම්කිසි අඩුවක් දක්නට ලැබේ.නමුත් වර්තමානය වන විට තේ වගාව හෙක්ටාර් දශ ලක්ෂ 222 පමණ පරාසයක් දක්වා පැතිරී ඇත.මෙසේ ශ්‍රී ලංකාව තුළ ශීඝ්‍ර ලෙස තේ වගාව ව්‍යාප්ත වීමට බලපෑ කරුණු කිහිපයක් ඇත.

ලංකාව තුළ සාර්ථකව තේ වගාව ව්‍යාප්ත වීමට භෞතික සාධක වල යහපත් බලපෑම ද බලපා ඇත. ලොව බොහෝ රටවල් අඟල් 24-36 වැසි සහිත ප්‍රදේශවල තේ වගා කරන අතර ශ්‍රී ලංකාවේ අඟල් 150-200 වර්ෂාපතන ඇති ප්‍රදේශවල තේ වගා කරයි. ලංකාව සමකාසන්න රටක් වීම නිසා වාර්ෂික උෂ්ණත්වය $65F^0 - 75F^0$ අතර පැවතීම නිසා එය තේ වලට යෝග්‍ය ලෙස බලපායි. ලංකාවේ ඇති හුණුගල් සහිත රතුවන් පස ද තේ සඳහා ඉතා උචිත පසක් වේ. මෙසේ පසේ PH අගය (ආම්ලිකතාවය) 6.0-6.5 අතර වීම නිසා තේ වගාවට එය උචිත තත්ත්වයක් විය (ඊරියගම, 2011).

ලංකාව තුළ තේ වැවෙන ප්‍රදේශ ගත් විට ප්‍රධාන කලාප 3 ක සිදු වෙයි. පහතරට තේ කර්මාන්තය , මුහුදු මට්ටමේ සිට අඩි 1200- 4000 දක්වාත්, කඳුරට ප්‍රදේශය මුහුදු මට්ටමේ සිට අඩි 4000-7000 ඊට මඳක් උස ප්‍රදේශවල තේ වගාව කරනු ලබයි(වීරවර්ධන.1963). 1833 වන විට එළිකරන ලද ඉඩම් වලින් විශාල ප්‍රමාණයක් ගෙවීන් සතු වූ අතර ඒවාට නීතිමය ලියවිලි ගොවීන් සතුව නොතිබුණ නිසා තේ වගාවට ඒවා පහසුවෙන් අත්පත් කර ගත්හ. ගංගා පෝෂක ප්‍රදේශ ලෙස ශ්‍රී ලාංකිකයන් ඉතිරි කර තිබූ බිම් ද විදේශිකයෝ එම උස් බිම් තේ වගාව සඳහා පහසුවෙන් යොදා ගත්හ. මේ නිසා මුල් කාලය වන විට පහතරට ප්‍රදේශවල හා උඩරට ප්‍රදේශ විදේශිකයන්ගේ ඉඩම් වල සේවය කිරිමට ස්වදේශිකයන් අකමැති වුවත් කොන්ත්‍රාත් පදනම මත වනාන්තර එළි පෙහෙළි කිරිම , දැව ප්‍රවාහනය , ඉදිකිරිම් , ආදියට සම්බන්ධ විය. මෙලෙස තේ වගාව සඳහා අවශ්‍ය වන පාරිසරික සාධකයන් ගෙන් බොහෝමයක් ඉටු වී තිබීම නිසා තේ වගාව සාර්ථකව ව්‍යාප්ත වීමට එම යහපත් සාධක බලපෑවේය.

### ශ්‍රී ලංකාවේ තේ වගාවේ මෑත කාලීන ප්‍රවණතා

ශ්‍රී ලංකාවේ තේ වගාවේ, වගා බිම් ප්‍රමාණය,නිෂ්පාදනය සහ අපනයන සංයුතිය 2006-2015

| වර්ෂය | මුළු වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර දහස් | නිෂ්පාදනය කි.ග්‍රෑ.දෑ.ල: | අපනයන ප්‍රමාණය කි. ග්‍රෑ. දෑ ල: | අපනයන වටිනාකම රුපියල් දෑ ල: |
|---|---|---|---|---|
| 2006 | 222 | 317.2 | 308.9 | 81,481 |
| 2007 | 222 | 304.6 | 311.8 | 113,565 |
| 2008 | 222 | 317.7 | 319.7 | 137,600 |
| 2009 | 222 | 289.8 | 289.7 | 136,171 |
| 2010 | 222 | 329.0 | 328.0 | 155,376 |
| 2011 | 222 | 328.6 | 323.0 | 164,869 |
| 2012 | 222 | 326.3 | 319.9 | 180,429 |
| 2013 | 222 | 340.0 | 319.1 | 199,446 |
| 2014 | 222 | 338.0 | 327.3 | 212,588 |
| 2015 | 222 | 329.0 | 306.9 | 182,054 |

මූලාශ්‍රය : තේ පාලකගේ පාලන වාර්තා / ශ්‍රී ලංකා මහ බැංකු (වාර්ෂික වාර්තා)

2006 වර්ෂයේ දී තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් දශ ලක්ෂ 317.2 පමණ අගයක් ගනු ලැබීය. මෙම නිෂ්පාදනය පසුගිය වර්ෂවලට සාපේක්ෂව බලන කල සුළු වශයෙන් අඩු තත්ත්වයක් දැකිය හැකි විය. එයට හේතු වූයේ පොහොර සහනාධාරය සංශෝධනය කිරීම, කාලගුණ තත්ත්වය දැඩි වෙනස්වීම්වලට භාජනය වීම සහ වසරේ අග භාගයේදී පැවති කම්කරු වැඩ වර්ජනය නිසා තේ නිෂ්පාදනය අඩු විය (වාර්ෂික මහබැංකු වාර්තා).

2006 වසරේ දී කෘෂිකාර්මික අංශයේ අපනයනයන් ද ඉහළ ගියේ ය. කෙන්යාවේ පැවති නියඟය හේතුවෙන් ලෝක වෙළෙඳපොළෙහි තේ සැපයුමේ වූ පසුබෑම සහ ස්වාධීන පොදු රාජ්‍ය මණ්ඩලයීය (CIS) සහ මැද පෙරදිග රටවලින් නිර්මාණය වූ ඉහළ ඉල්ලුම තුළින් , ඇති වූ වාසිදායක තත්ත්වය තුළින් තේ අපනයන වාර්තාගත ලෙස ඉහළ ගියේ ය. කෙසේ වුව ද ජෝර්දානය, ඉරානය සහ ලිබියාවට අපනයනය කළ තේ අඩුවීමෙන් එකතු කළ වටිනාකමක් සහිත තේ අපනයනය පහළ ගියේ ය(වාර්ෂික මහබැංකු වාර්තා).

2007 වර්ෂයේ තේ නිෂ්පාදනය කි.ග්‍රෑ. දශ ලක්ෂ 305 දක්වා 2% කින් සුළු වශයෙන් අඩුවිය(වාර්ෂික මහබැංකු වාර්තා,2007). 2006 වසර අග භාගයේදී වතු අංශයේ කම්කරුවන් සෙමින් වැඩ කිරීමේ වෘත්තීය ක්‍රියාමාර්ගයෙන් අනතුරුව වැඩ වර්ජනය කිරීමත් ඉන් පසුව නියඟ සහිත කාලගුණික තත්ත්වයක් පැවතීමත් තේ නිෂ්පාදනය

පහත වැටීමට හේතු විය. නිර්දේශිත ප්‍රමාණයට වඩා අඩුවෙන් පොහොර භාවිතා කිරීම ද අඩු වීමට හේතු විය.

කෘෂිකාර්මික අපනයන අතරින් විශාලත ම අපනයන ප්‍රභවය වන තේ සඳහා 2007 තවත් සතුටුදායක වසරක් විය. 2007 වසරේදී ශ්‍රී ලංකාවේ තේ අපනයන ඉපැයීම් ඉතිහාසයේ ප්‍රථම වරට එ.ජ.ඩොලර් බිලියන 1ක සීමාව ඉක්මවා යන ලදී. අපනයන ආදායම දෙගුණයක් වීම සඳහා ආසන්න වශයෙන් වසර 17ක් පමණ ගත වී ඇත(වාර්ෂික මහබැංකු වාර්තා,2007). තේ මිල ගණන් තියුණු ලෙස ඉහළයාම නිසා අපනයන ඉපැයීම් ඉහළ ගිය අතර එමගින් සාපේක්ෂ වශයෙන් ඉහළ ගිය නිෂ්පාදන පිරිවැය සමනය කිරීමට හේතු විය. වර්ෂය තුළදී වැටුප් බලශක්ති මිල සහ පොහොර මිල සැලකිය යුතු ලෙස වැඩිවිය. 2007 ජුනි මස දී වතු කම්කරුවන්ගේ අවම දෛනික වැටුප රුපියල් 189 සිට රුපියල් 260 දක්වා සියයට 38 කින් වැඩිවිය. කුඩා තේ වතු හිමියන්ගෙන් මිලදී ගත් තේ දළු කි.ග්‍රෑ. 1 කට ගෙවූ මිලෙහි සාමාන්‍යය රුපියල් 40.88 දක්වා සියයට 40 කින් වර්ධනය විය. තේ නිෂ්පාදන අංශයෙහි සියයට 0.2 ක් පමණ වන වාර්ෂික නැවත වගා කිරීමේ අනුපාතිකය ඉහළ නැංවීමේ අරමුණින් තේ සමාගම් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින්ද, කුඩා තේ වතු හිමියන්ගේ අංශය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් ද සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කෙරිණි. වර්ෂය තුළ උපද්‍රව විශ්ලේෂණ සහ අවධි ලක්ෂ්‍යය පාලන පද්ධතිය (HACCP) පිළිබඳ සහතික පත්‍රය ලබා ගැනීමේ අරමුණින් තේ කර්මාන්තශාලා නවීකරණ වැඩසටහන්වලට ඉහළ ප්‍රමුඛතාවයක් හිමි වූ අතර එම සහතික පත්‍ර ලබා ගැනීම ඔවුන්ගේ නිෂ්පාදිතවල එකතු කළ වටිනාකම ඉහළ යාමට හේතු වනු ඇත. එමෙන්ම, තේ කර්මාන්තශාලා සඳහා අඩු පිරිවැයකින් විදුලිය ලබා ගැනීම සඳහා කුඩා බලශක්ති බලාගාර සංවර්ධනය කිරීම දිරි ගන්වා ඇත (වාර්ෂික මහබැංකු වාර්තා, 2007).

2008 වර්ෂයේ පළමු භාගයේ දී තේ නිෂ්පාදනය සියයට 19 කින් ඉහළ ගියේ ය. පසුව 2008 වර්ෂය අවසානය වන විට මෙම වර්ධනය සියයට 4.1 දක්වා මන්දගාමී වීමට තේ සඳහා ලෝක ඉල්ලුමේ පහළයාම බලපෑවේය(වාර්ෂික මහබැංකු වාර්තා,2008). පළමු භාගයේ ඉහළ ගිය නිෂ්පාදනයට සියලුම තේ වැවිලි දිස්ත්‍රික්කවල පැවති හිතකර කාලගුණ තත්ත්වය, තේ කර්මාන්තශාලා බාධාවකින් තොරව ක්‍රියාත්මක වීම හා කලට වේලාවට තේ ගස් කප්පාදු කිරීම, නිරිදේශිත ප්‍රමාණයෙන් පොහොර භාවිතය හා කෘමිනාශක භාවිතය යනා දී යෝග්‍ය කෘෂිකාර්මික භාවිතයන් බලපාන ලදී.

රජය විසින් ද තේ කර්මාන්තයට ආධාර කිරීම සඳහා ක්‍රියාමාර්ග කිහිපයක් 2009 වසර සඳහා වන අයවැය ලේඛනය තුළින් හා ඉන් අනතුරුව 2008 වසරේ දෙසැම්බර් මස අග දී ඉදිරිපත් කළ ආර්ථික සහන පැකේජය තුළින් හා ඉන් අනතුරුව 2008 වසරේ දෙසැම්බර් මස අගදී ඉදිරිපත් කළ ආර්ථික සහන පැකේජය තුළින් හඳුන්වා දෙන ලදී. මෙම ක්‍රියාමාර්ග අතර අමු තේ දළු කිලෝවක් සඳහා රුපියල් 40ක මිලක් ලැබෙන තෙක් කිලෝග්‍රෑම් 50ක මිශ්‍ර පොහොර මල්ලක් රුපියල් 1000 ක මිලට කුඩා තේ වතු හිමියන්ට සැපයීමත්, තේ කර්මාන්තශාලා හිමියන්ට බැංකු හරහා සියයට 6ක පොලී දීමනාවක් තේ අර්බුදය මධ්‍යයේ රජය විසින් යලි ස්ථාපිත කරන ලද තේ ස්ථායිකරණ අරමුදල හරහා සැපයීමත් ඇතුළත් විය. එසේම තේ කර්මාන්ත කරුවන් මුහුණ දෙන මූල්‍ය ගැටළු වලට පිළියමක් ලෙස තේ කර්මාන්තශාලා නවීකරණය සඳහා වැවිලි සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ලබා දී තිබූ ආපසු අයකර ගැනීම තාවකාලිකව වසරකට අත්හිටුවීමටත් ක්‍රියාකරන ලදී. මෙයට අමතරව, ආනයනය කරන ලබන තේ කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 4 ක සෙස් බද්දක් අයකිරීම තුළින්

ආනයනය කරනු ලබන ගුණත්වයෙන් අඩු තේ සමග ශ්‍රී ලංකා තේ මිශ්‍ර කිරීම අධෛර්යමත් කිරීම හා තේ පැකට් හා මළු සඳහා වන අපනයන බද්ද නිදහස් කිරීමටත් ක්‍රියාමාර්ග ගනු ලැබී ය. එසේ ම ශ්‍රී ලංකාවේ මිත්‍ර රටවල ආනයනකරුවන්ට භාණ්ඩාගාරයේ ඇපවීම මත කෙටිකාලීන ණය පදනම මත තේ අපනයනය කිරීම හඳුන්වා දෙමින් කර්මාන්තයේ තිරසාර පැවැත්ම සහතික කිරීම සඳහා රජය ක්‍රියා කළේ ය(වාර්ෂික මහබැංකු වාර්තා, 2008).

2009 වර්ෂය අගභාගය තුළ දී සැලකිය යුතු ලෙස තේ මිල ගණන් ඉහළ ගිය ද සැපයුම අඩුවීම හේතුවෙන් අපනයන පරිමාව අඩුවීම නිසා තේ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 1,185 ක් දක්වා සියයට 6.8 කින් පහත වැටුණි. ලොව තෙවන විශාලතම තේ අපනයනකරු ලෙස ශ්‍රී ලංකාව, කෙන්යාවට සහ චීනයට පසු රැඳී සිටී. ලෝක වෙළෙඳපොළ තුළ තේ සැපයුම අඩුවීම මෙන්ම අදාළ බලධාරීන් විසින් ශ්‍රී ලංකාව තේ සඳහා ඉහළ තත්ත්වයක් රඳවා ගැනීමට හඳුන්වා දුන් ක්‍රියා මාර්ග ශ්‍රී ලංකා තේ කර්මාන්තයට සතුටුදායක පෙර නිමිත්තක් වූ අතර ශ්‍රී ලංකා තේ 2009 වසර තුළ නොකඩවා ඉහළ මිලක් ආකර්ශනය කර ගැනීමට සමත් විය (වාර්ෂික මහබැංකු වාර්තා, 2009). 2008 වසර හා සැසඳීමේ දී 2009 වසර තුළ තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 290ක් දක්වා සියයට 9.1 කින් අඩු විය. තේ වගා කරන්නා වූ දිස්ත්‍රික්කවල පැවති වියළි කාලගුණික පරිසරය මෙම අඩුවීම සඳහා බෙහෙවින් හේතු විය. 2009 වසර අවසානයේදී වතු කම්කරුවන් විසින් සිදුකරන ලද අකුරට වැඩ කිරීම වැනි වැඩ වැරීම් කටයුතු ද තේ කර්මාන්තයේ වර්ධනයට යම් බාධාවක් විය. 2009 වසර තුළදී ශ්‍රී ලංකාවේ මෙන්ම වෙනත් තේ නිපදවන බොහෝමයක් රටවලද නිෂ්පාදනය පහළ ගිය අතර ඒ හේතුවෙන් 2008 වසර හා සැසඳීමේදී 2009 වසර තුළ ලෝක තේ නිෂ්පාදනය සියයට 2.2 කින් අඩු විය (වාර්ෂික මහබැංකු වාර්තා, 2009).

2010 වසරේ දී තේ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1375 ක් දක්වා සියයට 16.1 කින් වර්ධනය විය. ප්‍රධාන වශයෙන් "සිලෝන්ටී"වල ඇති ඉහළ ගුණාත්මකභාවය සහ සම්ප්‍රදායික තේ සඳහා පැවති ඉහළ ජාත්‍යන්තර ඉල්ලුම හේතු කොට ගෙන 2010 වසර තුළදී ලෝකයේ ප්‍රධාන තේ වෙන්දේසි මධ්‍යස්ථාන අතුරින් "සිලෝන්ටී" අඛණ්ඩව ඉහළ මිල ගණන් අත් කර ගන්නා ලදී. 2010 වසරේදී තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල එ.ජ.ඩොලර් 4.38 ක් ලෙස සියයට 7 කින් වර්ධනය විය. තේ නිෂ්පාදනය කරන අනෙකුත් ප්‍රධාන රටවල් දේශීය පරිභෝජනය ඉහළයාම සහ නියඟ තත්වයන් පැවතීම හේතුවෙන් ජාත්‍යන්තර වෙළඳපොළෙහි කළු තේ සඳහා හිඟයක් පැවතුණි. තේ අපනයනයන්හි එකතු කළ අගය වැඩිකිරීම ධෛර්යමත් කිරීමේ අරමුණින් තොග තේ සඳහා වූ සෙස් බද්ද 2010 නොවැම්බර් 23 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි තේ කිලෝ ග්‍රෑමයකට රුපියල් 10 දක්වා වැඩි කරන ලදී (වාර්ෂික මහබැංකු වාර්තා, 2010). 2010 වසරේ සමස්ත තේ නිෂ්පාදනය මෙතෙක් පැවැති ඉහළම නිෂ්පාදන මට්ටම වාර්තා කරමින් කිලෝ ග්‍රෑම් මිලියන 329 ක් දක්වා සියයට 13 කින් වර්ධනය විය. පසුගිය වසරේ සිට නොකඩවා ඉහළ මිල ගණන් පැවතීම නිසා වැඩි දියුණු කළ කෘෂිකාර්මික සහ තේ සැකසීම් ක්‍රම කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට වගාකරුවන් යොමුවීමද මෙම වර්ධනයට හේතු විය. කුඩා තේ වතු හිමියන්ට ලබාදෙන පොහොර සහනාධාරය නොකඩවා ක්‍රියාත්මක වීම ද ඵලදායිතාව ඉහළ යාමට ඉවහල් විය (වාර්ෂික මහබැංකු වාර්තා, 2010).

2011 වසරේ සමස්ත තේ නිෂ්පාදනය 2010 වසරට සාපේක්ෂව සියයට 0.8 ක සුළු වශයෙන් පහළ යාමක් පෙන්නුම් කරමින් කිලෝ ග්‍රෑම් මිලියන 329 ක් විය. කුඩා තේ වතු හිමියන්ට පමණක් සීමිතව පැවති රජයේ පොහොර සහන වැඩපිළිවෙළ

වතු වැවිලි අංශයට ද ලබා දීම මගින් වැවිලි සමාගම්වල නිෂ්පාදන පිරිවැය අඩු කිරිමට උපකාරී වුව ද, 2011 වසරේ වතු අංශයේ සේවක වැටුප් ඉහළ දැමීම එම සමාගම්වල ලාභ අඩු වීමට හේතු විය. වසර තුළදී තේ නිෂ්පාදකයින්ගේ සාමාන්‍ය තේ නිෂ්පාදනය බොහෝ දුරට ස්ථාවර මට්ටමක පවත්වයාමට පැවති හිතකර අපනයන මිල ගණන් උපකාරි විය. 2011 වසරේ දෙවන භාගයේදී මැද පෙරදිග සාම්ප්‍රදායික ගමනාන්තයන්ට තේ අපනයනය කිරීම අඩු වුවද තේ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1491 දක්වා සියයට 3.5 කින් වර්ධනය විය(වාර්ෂික මහබැංකු වාර්තා,2011).

2012 වසරේ තේ අපනයන පරිමාව කිලෝ ග්‍රෑම් මිලියන 320ක් දක්වා සියයට 0.9 කින් අඩුවීම සහ අපනයන කරන ලද තේවල සාමාන්‍ය මිල අඩුවීම හේතුවෙන් මුළු අපනයන සියයට 15ක් පමණ වූ තේ අපනයන ආදායම එ.ජ.ඩොලර් මිලියන 1,412 ක් දක්වා සියයට 5.3 කින් පහත වැටුණි.

2013 වසරේ තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 340.2 ක් දක්වා සියයට 3.6 කින් ඉහළ ගියේය. කෙසේ වෙතත්, 2013 වසරේ තේ නිෂ්පාදනයේ ඉහළ යාම සිදුවුයේ පැවැති වියලි කාලගුණ තත්ත්වයන්ගේ බලපෑම මත 2012 වසරේ දී පහළ ගිය තේ නිෂ්පාදනයට සාපේක්ෂව යි.

2014 වසරේ තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 338 ක් දක්වා සුළු වශයෙන් අඩු විය. මුළු තේ නිෂ්පාදනය තුළ සියයට 62.1 ක දායකත්වයක් දක්වන පහත්බිම් තේ නිෂ්පාදනය, 2014 වසර තුළ කිලෝ ග්‍රෑම් මිලියන 210 ක් දක්වා සියයට 0.8 කින් ඉහළ ගියේ ය. 2015 වසරේදී තේ නිෂ්පාදනය අඛණ්ඩව දෙවන වසරටත් පහළ ගියේ ය. සමස්ත තේ නිෂ්පාදනය 2014 වසරේ පැවති කිලෝග්‍රෑම් මිලියන 338 වූ ප්‍රමාණය 2015 වසරේදී කිලෝග්‍රෑම් මිලියන 329 ක් දක්වා සියයට 2.7 කින් පහළ ගියේය. තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය අපනයන මිල 2014 වසරේ පැවති කිලෝ ග්‍රෑමයට එ.ජ.ඩොලර් 4.97 හි සිට 2015 වසරේ දී කිලෝ ග්‍රෑමයට එ.ජ.ඩොලර් 4.37 ක් දක්වා සියයට 12.2 කින් කැපී පෙනෙන ලෙස අඩු වූ අතර අපනයන පරිමාවද කිලෝ ග්‍රෑම් මිලියන 307 ක් දක්වා සියයට 6.2 කින් අඩු විය (වාර්ෂික මහබැංකු වාර්තා, 2015).

**සමාලෝචනය**

තේ වගාව ඉතා කුඩා වගාවක් ලෙස ශ්‍රී ලංකාව තුල ආරම්භ වුව ද වර්තමානය වන විට එය ඉතා විශාල ප්‍රදේශයක් පුරා පැතිරී ඇත. එනම් 1867 දී හෙක්ටාර් 8 පමණ කුඩා ප්‍රදේශයක තේ වගාව ව්‍යාප්ත කළද පසුව එය ශීඝ්‍රයෙන් ව්‍යාප්ත විය. ඒ අනුව 2015 වර්ෂය වනවිට තේ වගාකළ මුළු බිම් ප්‍රමාණය හෙක්ටාර් දශ ලක්ෂ 222 ක පමණ පරාසයක් දක්වා පැතිරී ඇත. කෘෂිකාර්මික අපනයන ඉපැයීම් අතින් ඉහළ ආදායමක් වර්තමානය වන විට තේ වගාව අත්පත් කර ගෙන ඇත. මීට වසර කිහිපයකට පෙර තේ අපනයන වෙළෙඳපළ තුළ ශ්‍රී ලංකාව ප්‍රමුඛ ස්ථානයේ පසු වූ අතර මේ වන විට ලංකාව තෙවන ස්ථානයට පත්ව ඇත. ලෝක තේ අපනයන වෙළෙඳපොළ තුළ ශ්‍රී ලංකාව පසු කරමින් කෙන්යාව සහ ඉන්දියාව ඉදිරියට පත්ව ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ**

ඊරියගම තිස්ස(2007), වැවිලි ආර්ථිකය,ජයන්ති ප්‍රින්ට් මුද්‍රණාලය,ගනේමුල්ල

ඊරියගම තිස්ස(2011), ශ්‍රී ලංකාවේ ආර්ථික ඉතිහාසය,ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ,කොළඹ 10

ජයවර්ධන සරත්චන්ද්‍ර(2008),ඔසු ගුණ පිරි තේ,ඇස්.ගොඩගේ සහ සහෝදරයෝ,කොළඹ 10.

ද සිල්වා රසාංගිකා(2005), ශ්‍රී ලංකාවේ තේ ඉතිහාසය, සමන්ති පොත් ප්‍රකාශකයෝ,කොළඹ

ධනපාල ඒ .එච්.(1985),භෝග වගාව සහ ආර්ථික කටයුතු(ආර්ථික භූගෝල විද්‍යා ප්‍රවේශය) මයුර ප්‍රින්ටර්ස්,කොළඹ

විද්‍යාරත්න ඒ.කේ. (2001), ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්තය තුළ කුඩා තේ වතු අංශයේ දායකත්වය පිළිබඳ විග්‍රහය, කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය

මහජන බැංකුව,ආර්ථික විමසුම(2001)ජනවාරි/මාර්තු,මහජන බැංකු පර්යේෂණ අංශය,කොළඹ.

මහජන බැංකුව,ආර්ථික විමසුම(2006)සැප්තැම්බර්/දෙසැම්බර් ,මහජන බැංකු පර්යේෂණ ආයතනය,කොළඹ.

ශ්‍රී ලංකා මහ බැංකුව, වාර්ෂික වාර්තා (2006, 2007, 2008, 2009, 2010, 2011, 2012, 2013, 2014, 2015), ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ.

සිරිවර්ධන පී.එම්.(2000), ශ්‍රී ලංකාවේ තේ වතු පෞද්ගලීකරණය තුළින් ඇති වූ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යනයක් ,කැලණිය විශ්ව විද්‍යාලය, කැලණිය